original



05 OCT 2020

# එක්සත් සමාජවාදී පක්ෂයේ ව්‍යවස්ථාව

1. නාමය — පක්ෂයේ නාමය එක්සත් සමාජවාදී පක්ෂය වන්නේය.

2. අරමුණු

A ශ්‍රී ලංකා ජනතාවගේ යහ සාධනය ප්‍රවර්ධනය කිරීම

B ශ්‍රී ලංකාව තුළ ආර්ථික, දේශපාලනමය හා සමාජ සබඳතාවයන්හි ප්‍රගතිශීලී පියවර උදෙසා සටන් කිරීම හා ශ්‍රී ලංකාව තුළ සමාජවාදී සමාජයක් ස්ථාපනය කිරීම.

C ශ්‍රී ලංකාවේ ජාතික නිදහස ස්වාධිපත්‍යය හා භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම.

D මානව හිමිකම් ප්‍රජාතාන්ත්‍රික හිමිකම් ආදී ක්‍රියාවලියන් ආරක්ෂා කරමින් ප්‍රවර්ධනය කිරීම.

E ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ජනතාවන්ට තමා කැමති ආගමක් ඇදහීමට හා ආගමික වතාවත්වල නිරතවීමට ඇති නිදහස එකහා සමාන ලෙස තහවුරු කිරීම හා ආගම් නොඅදහා සිටීමට තිබෙන අයිතිය ආරක්ෂා කිරීම. (පසුව සංශෝධනය කරන ලද කොටසකි)

F එක්සත් ශ්‍රී ලංකාවක් තුළ ජාතීන්හට ස්වයංනිර්ණයක් සඳහා ඇති අයිතිය තහවුරු කිරීම.

G සියළුම ජාතීන් හා ජන වාර්ගික ප්‍රජාවන් අතර මිත්‍රත්වයේ සමානාත්මතාවයේ සහයෝගිතාවයේ පරමාදර්ශයන් ප්‍රවර්ධනය කිරීම හා එම ජාතීන්ට හා ජනවාර්ගික ප්‍රජාවන්ට සිය අනන්‍යතාවය හා සංස්කෘතිය වර්ධනය කිරීමට ඇති අයිතිය තහවුරු කිරීම.

H දේශපාලන ආර්ථික සමාජයීය හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි ඕනෑම තලයක පුරුෂයන්ට හා කාන්තාවන්ට ඇති සම අයිතිය තහවුරු කිරීම හා ළමා පරපුර ආරක්ෂා කිරීම සඳහා හැකි සියළු ප්‍රයත්න දැරීම.

I තරුණ පිරිස් සඳහා නිදහස් අධ්‍යාපනය හා රැකියා නියුක්තිය වැනි සියළු අවස්ථාවන් ලබාදීම හා ඔවුන්ගේ අයිතීන් තහවුරු කිරීම.

J අධිරාජ්‍යවාදයට, ධනවාදයට, ජාතිවාදයට, ඒකාධිපතිවාදයට, කුලවාදයට. පුරුෂාධිපත්‍යයට විරුද්ධව සටන් කිරීම හා ශ්‍රී ලංකාව තුළ ඕනෑම අන්දමක වෙනස් කොට සැලකීමේ ක්‍රියාවලියකට විරුද්ධව සටන් කිරීම.

K පක්ෂයේ අරමුණු තවදුරටත් පුළුල් කරනු පිණිස පවත්වනු ලබන මැතිවරණ සඳහා ඉදිරිපත්වීම හා තරඟ කිරීම.

L ජාත්‍යන්තර සබඳතා ක්ෂේත්‍රය තුළ - අධිරාජ්‍යවාදයට ධනවාදයට හා ජාතික විමුක්තියට ස්වයංනිර්ණය සඳහා මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට හා සමාජ ප්‍රගමනයට කරනු ලබන අරගලවලට සහයෝගය දැක්වීම තුන්වන ලෝකයේ රටවල සහයෝගිතාවය ශක්තිමත් කිරීම සඳහා ආධාරවීම. මුළු ලෝකයපුරා දැනට සිදුවන සමාජවාදී ක්‍රියාවලියන් සමග සහයෝගිතාවය පවත්වාගැනීම හා අධිරාජ්‍ය විරෝධි

ප්‍රගතිශීලී ආණ්ඩු වෙත සහයෝගය පල කිරීම.

M නයෂ්ටික අවි හා ජන සංහාරයක් සිදුකල හැකි ඕනෑම වර්ගයක අවි තහනම් කිරීම සඳහා සිදු කරනු ලබන සියලු ව්‍යාපාර හා අරගලවලට හා පොදු වශයෙන් නිරායුධකරණයට හා ලෝක සාමය ස්ථාපිත කිරීමට සහයෝගය දැක්වීම.

3. සාමාජිකත්වය

පක්ෂය, පක්ෂ සාමාජිකයන්ගෙන් සමන්විතවෙයි. මීට ඉහතින් දැක්වෙන අරමුණු පිළිගන්නා හා නියම කරනු ලබන සාමාජික මුදල ගෙවීමට එකඟවන ඕනෑම අයෙකුහට පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීමේ හැකියාව ඇත. පළාත් වශයෙන් පිහිටවනු ලබන ශාඛාවන්හි හා මධ්‍යම කාරක සභාව තීරණය කරනු ලබන ඕනෑම අයුරකින් සාමාජිකත්වය සංවිධානය කරනු ඇත.

4. මහා සම්මේලනය

a සමස්ත සාමාජිකත්වයෙන් හෝ පක්ෂ ශාඛා විසින් තෝරාගත් නියෝජිතයන් සහභාගිවන පක්ෂයේ මහා සම්මේලනයක් වසර දෙකකට වරක් පැවැත්වෙනු ඇත.

b පක්ෂයේ යම් කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරනු ලබන තීරණ/ යෝජනා වේ නම් ඒවා මහා සම්මේලනයේ අනුමැතිය ලැබීමට යටත්වෙයි.

c මහා සම්මේලනය මගින් මධ්‍යම කාරක සභාව සඳහා සාමාජිකයන් තෝරාගනු ලබයි.

5. විශේෂ මහා සම්මේලනය

a මහා සම්මේලනයක් මගින් විවාදයට/ සාකච්ඡාවට/ අනුමැතියට යම් විශේෂ කරුණු භාජනය කලයුතු බවට මධ්‍යම කාරක සභාව තීරණය කළවිට මධ්‍යම කාරක සභාව විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට පියවර ගනු ලැබේ.

b අවම වශයෙන් සති තුනකට කලින් එවැනි දැනුම්දීමක් කලයුතුවේ. සාමාන්‍ය වැඩි ඡන්දයෙන් එවැනි තීරණ අනුමත කල හැකිවේ.

6. මධ්‍යම කාරක සභාව

a පක්ෂයේ පාලන බලය හිමි වන්නේ මහා සම්මේලනය විසින් තෝරාපත් කර ගන්නා මධ්‍යම කාරක සභාවටය.

b සාමාන්‍ය වැඩි ඡන්දය අනුව මධ්‍යම කාරක සභාව සියළු තීරණ ලබාදෙනු ඇත.

7. කමිටු

a විවිධවූ ක්ෂේත්‍රතුල පක්ෂයේ ක්‍රියාකාරීත්වයන් ඉදිරියට ගෙනයාමටත් ඒවා සම්බන්ධීකරණය සඳහාත් එවැනි කාර්යයන් සඳහා මධ්‍යම කාරක සබාව විසින් කාලීනව කමිටු පත්කරනු ලැබේ.

b එවැනි සියලුම කමිටු මධ්‍යම කාරක සභාවේ සමස්ත අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වනු ඇත.

8. නිලධාරී මණ්ඩලය

a මධ්‍යම කාරක සබාව විසින් පක්ෂය සඳහා සභාපතිවරයෙකු පත්කරනු ලබයි. පක්ෂයේ සියළුම රැස්වීම් වලදී මුලසුන දරන්නේ එම සභාපතිවරයාය.

b මධ්‍යම කාරක සභාව විසින් පක්ෂය සඳහා ලේකම්වරයෙකු පත්කරනු ලබයි.

පක්ෂයේ සියලු රැස්වීම් කැඳවනු ලබන්නේ ලේකම්වරයා විසිනි. පක්ෂයේ සියලු වාර්තා තබාගන්නේද ලේකම්වරයාය.

c මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ වැඩ කටයුතු සඳහා භාණ්ඩාගාරිකවරයෙකු පත්කරනු ලබයි. සියළුම අරමුදල් වෙනුවෙන් වගකීම හා භාරකාරත්වය දරන්නේ ඔහු විසිනි. පක්ෂයේ කිනම් හෝ අරමුදලකට මුදල් රැස්කිරීමේ හා එම මුදල් වියදම් කිරීමේ වගකීම ඔහු දරයි. භාණ්ඩාගාරික ලෙස ඔහුට පැවරෙන රාජකාරිය හා කාර්යභාරය වෙනුවෙන් ඔහු මධ්‍යම කාරක සභාවට වගකිව යුතුවෙයි.

9. අරමුදල් a පක්ෂය සඳහා අරමුදලක් ඇත. මධ්‍යම කාරක සභාව තීරණය කරනු ලබන අන්දම හා ප්‍රමාණය අනුව හැම සාමාජිකයෙක්ම එම අරමුදලට දායක විය යුතුය. වෙනත් යම් මූලාශ්‍රයකින් පක්ෂය වෙත ලැබෙන අනෙකුත් සියළුම මුදල් මෙම අරමුදලේ තැන්පත් කල යුතුය.

b විශේෂිත අවශ්‍යතාවයන් උදෙසා මධ්‍යම කාරක සභාව විසින් අරමුදලක් හෝ අරමුදල් ස්ථාපනය කරනු ඇත.

10. මහජන සම්බන්ධතා

a මධ්‍යම කාරක සභාව විසින් වරින්වර පක්ෂයේ ප්‍රතිපත්ති හා යථා දර්ශණය පිලිබඳව නිර්වචනය කරනු ඇත. එමෙන්ම කාලීනව අවශ්‍ය පරිද්දෙන් යම් වැඩ සටහන් කෙටුම්පත් හෝ ප්‍රතිපත්ති ප්‍රකාශණ සැලසුම් කරමින් පක්ෂය වෙනුවෙන් ප්‍රසිද්ධ ප්‍රකාශණයන් නිකුත් කරනු ඇත.

b සිය පෞද්ගලික මට්ටමින් හෝ එහි ලේකම්වරයා මගින් හෝ ඕනැම පුද්ගලයෙක් සංවිධානයක් හෝ ශ්‍රී ලංකා රජය සමග හෝ සාකච්ජා කිරීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

11. ක්‍රියාකාරීත්වය I - කිසියම් මැතිවරණයකදී තම පක්ෂයේ අපේක්ෂකයා /අපේක්ෂකයින් ඉදිරිපත් කිරීමෙන් හෝ වෙනත් සංවිධානයක් මගින් නම්කරන ලද අපේක්ෂකයෙකුට/ අපේක්ෂකයින්ට සහයෝගය පල කිරීමට පක්ෂය සැලසුම් කරයි නම්

a එම මැතිවරණයට තම අපේක්ෂකයා හෝ අපේක්ෂකයින් නම් කිරීමෙන් හෝ වෙනත් අයුරකින් නම් කරන ලද අපේක්ෂකයෙකු/ අපේක්ෂකයින් සඳහා සහාය පල කරමින් එම මැතිවරණයට සහභාගි විය යුතුය නැතහොත්,

b අදාල මැතිවරණයේදී/ මැතිවරණවලදී පක්ෂය විසින් ගන්නා ලද තීරණයට එරෙහිවීම පිලිබඳව ප්‍රසිද්ධ ප්‍රකාශයක් හෝ තම ස්ථාවරය පිලිබඳ ප්‍රකාශයක් කල හැකිය.

12. නිෂ්කර්ෂණය (ඉල්ලා අස්කර ගැනීම) නෙරපා හැරීම හා විසුරුවා හැරීම

a ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන උල්ලංඝනය කල විටදී හෝ පක්ෂයේ තීරණයට පටහැනි ලෙස ක්‍රියා කලවිට එම සාමාජිකයා මධ්‍යම කාරක සභාවේ වැඩි ඡන්දයෙන් ගනු ලබන තීරණයක් මගින් පක්ෂයෙන් නෙරපාහැරිය හැකිය. මේ අවස්ථාවේදී මධ්‍යම කාරක සභිකයින්ට හිමි වන්නේ එක් ඡන්දය බැගිනි.

b මහා සම්මේලනයේදී පොදු සාමාජිකයින් පිරිසක් විසින් පක්ෂය විසුරුවාහැරිය යුතුය යනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කර එය වැඩි ඡන්දයෙන් සම්මත වුවහොත් පක්ෂය විසුරුවා යවන ලද සේ සලකනු ඇත. මේ අවස්ථාවේදීද එක් සාමාජිකයෙකුට පාවිච්චි කල හැක්කේ එක් ඡන්දයක් පමණකි.

13. සංශෝධන

මධ්‍යම කාරක සභාවේ තීරණයකට අනුව කැදවනු ලබන විශේෂ සම්මේලනයකදී පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය කලයුතු බවට යෝජනාවක් ඉදිරිපත් වුවහොත් හා එය තුනෙන් දෙකක වැඩි ජන්ද ප්‍රමානයකින් සම්මත වුවහොත් එසේ සංශෝධනය කල යුතුවේ.

14 ප්‍රධාන කාර්යාලය

පක්ෂයේ ප්‍රධාන කාර්යාලය අංක 53/6 ඊ.ඩී. දාබරේ මාවත, නාරාහේන්පිට, කොළඹ 5 වේ.

2009 වසරේ ඔක්තෝබර් 31 හා නොවැම්බර් 01 දින පැවැති ජාතික සම්මේලනයේදී පක්ෂ ව්‍යවස්ථාවේ 2 කොටසේ E උප වගන්තිය අවසානය ආගම් නොඅදහා සිටීමට තිබෙන අයිතිය ආරක්ෂා කිරීම යනුවෙන් ඒක ජන්දයෙන් සම්මත කර ගන්නා ලදි.

සිරිතුංග ජයසූරිය
ප්‍රධාන ලේකම්
එක්සත් සමාජවාදී පක්ෂය

18/09/2015

සිරිතුංග ජයසූරිය
ප්‍රධාන ලේකම්
එක්සත් සමාජවාදී පක්ෂය

22/09/2020